ජාතික සමාජ සංවර්ධන ආයතනය - 2010

--------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

---------------

1.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව ජාතික සමාජ සංවර්ධන ආයතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

1.2.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

----------------------------------------------------------------------

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) මුදල් රෙගුලාසි<br>(i) මු.රෙ. 165 | දෛනිකව ලැබෙන මුදල් සටහන් කිරීමට ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ආ) 2007 අංක 14 දරන එකතු කළ අගය මත බදු සංශෝධන පනතේ 07 වගන්තිය | රු. 1,714,750 ක් වූ ගෙවීම්වල ඇතුළත් රු. 374,384 ක් වූ වැට් බදු මුදලින් 1/3 ක් වූ රු. 124,794 ක් රඳවා ගෙන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>-----------------------------<br>2008 ජූනි 26 දිනැති අංක 13/2008 චක්‍රලේඛයේ 05 ඡේදය | ඉන්ධන දීමනාව හිමි තනතුරු දෙකක රාජකාරි ඉටු කරන විට එම නිලධාරීන්ට හිමි වන්නේ එක් |

ඉන්ධන දීමනාවක් වුවද සභාපතිනියට හිමි එක් ඉන්ධන දීමනාවට අමතරව රු.407,868 ක් ඉන්ධන දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.7,596,610 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.9,353,654 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සසඳන විට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,757,044 ක වර්ධනයක් විය. සමස්ථ වියදම රු. 2,091,831 කින් අඩුවීම විශේෂයෙන් එම වර්ධනයට බලපා තිබුණි.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

#### 2.2.1 අනාර්ථික ගනුදෙනු

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) i. ජාතික සමාජ සංවර්ධන ආයතනය අනුරාධපුර තලාවේ පවත්වාගෙන යාමේ අරමුණින් ඒ සඳහා අවශ්‍ය ගොඩනැගිලි රු. මිලියන 16 ක් වැය කර 2002 මාර්තු 31 උන ඉදිකර අවසන් වුවත් එම ආයතන එහි ස්ථානගත කර නොතිබුණි. දැනට එම ආයතනය පවත්වාගෙන යන නාවල කොස්වත්තහි පිහිටි ගොඩනැගිල්ල සඳහා කුලී වශයෙන් 2010 වර්ෂයට අදාලව රු.12,432,000 ක වියදම් දරා තිබුණි.

ii. අනුරාධපුර තලාවේ පිහිටි කාර්යාලය සඳහා පොදු කාර්යය වියදම් හැර සමාලෝචිත වර්ෂයේ එහි අනුයුක්ත නිලධාරීන්ට ගෙවූ වැටුප් හා වේතන රු.658,971 ක් හා අතිකාල දීමනා රු.64,726 ක් වශයෙන් එකතුව රු.723,697 ක් වැය කර තිබුණද එම කාලය තුළ ලැබූ දේශන ශාලා කුලී ආදායම රු.153,920 ක් විය. පසුගිය වර්ෂයේ ලැබූ ආදායම වූ රු.173,830 හා සැසඳීමේදී තලාව ආයතනයේ කුලී ආදායම 11% කින් පහත වැටී තිබුණි.

**2.2.2 කාර්ය සාධනය**

----------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) **අධ්‍යයන අංශය**

-----------------

**සමාජ වැඩ (ශාස්ත්‍රවේදී) ඉංග්‍රීසි උපාධිය**

-------------------------------------------

2006/2010, 2007/2011, 2008/2012, 2009/2013 හා 2010/2014 ලෙස කණ්ඩායම් වලින් යුතු එක් එක් කණ්ඩායම් සඳහා විභාග පැවැත්වීම, බඳවා ගැනීම, සහතික ලබා දීම, ක්ෂේත්‍ර කටයුතු යනාදිය පිළිබඳ වෙන් වෙන්ව භෞතික කාර්ය සාධනය දක්වා නොතිබුණි.

(ආ) **පර්යේෂණ හා ප්‍රතිපත්ති පකාශන අංශය**

-------------------------------------------

2010 වර්ෂයේදී පහත සඳහන් දිනයන්හි සිදු කිරීමට සැලසුම් කළ පහත සඳහන් වැඩසටහන් සිදු කර නොතිබුණි.

| වැඩසටහන | | සිදු කිරීමට අපේක්ෂිත කාලය |
|---|---|---|
| (i) | අන්තර්ජාලය සඳහා සඟරාවක් නිර්මාණය කිරීම E-news letter | 2010 ජනවාරි |
| (ii) | සමාජ වැඩ විෂයය පිළිබඳ ලියැවුණු සඟරාවක් ප්‍රකාශයට පත් කිරීම | 2010 පෙබරවාරි 01 - අප්‍රේල් 25 |
| (iii) | පර්යේෂණ කරන ආයතන සමඟ සම්බන්ධතා ජාලයක් ගොඩ නඟා ගැනීම | 2010 පෙබරවාරි 03 - පෙබරවාරි 18 |
| (iv) | සමාජ වැඩ විෂයය හදාරන සිසුන්ගේ ක්ෂේත්‍ර වැඩ පිළිබඳ ඇගයීම් කිරීම | 2010 ජූනි 03 - ඔක්තෝබර් 30 |

**2.2.3 සංයුක්ත සැලැස්ම**

-------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය ප්‍රකාර සංයුක්ත සැලැස්ම සකස් කර නොතිබුණි.

2.2.4 අභ්‍යන්තර විගණනය

----------------------

අභ්‍යන්තර විගණන වැඩ සටහන් පිළියෙල කල යුතු අතර විගණකාධිපතිගේ උපදේශකත්වයෙන් එය වැඩිදියුණු කල යුතුය. තවද අභ්‍යන්තර විගණන වාර්තා විගණනයට ඉදිරිපත් කල යුතුය. එසේ වුවද, අභ්‍යන්තර විගණන වැඩ සටහන් පිළියෙල කර නොතිබූ අතර, විගණන වාර්තා විගණකාධිපතිට ලබාදී නොතිබුණි.

2.2.5 අය වැය පාලනය

------------------

ආයතනය විසින් 2010 වර්ෂය තුළදී ඉටු කිරීමට බලාපොරොත්තුවන කාර්යයන්ට අදාලව ක්‍රියාකාර සැලැස්ම කාර්තු වශයෙන් පිළියෙල කර නොතිබුණ අතර ක්‍රියාකාර සැලැස්ම අනුව අය වැය ලේඛනයේ එක් එක් වැඩසටහන සඳහා මුදල් පතිපාදනය කර නොතිබුණි.

3. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) මූල්‍ය පාලනය

(ආ) ගබඩා පාලනය

(ඇ) ශිෂ්‍යාධාර ගෙවීම